**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ඇ) නිරීක්ෂණය හැර, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී වැඩ අවසන් කරන ලද නව පොදු වෙළඳපල ව්‍යාපෘතියේ ගොඩනැගිලිවල ඉදිකිරීම් වටිනාකම රු.26,216,617 ක් වුවත්, ගොඩනැගිලි ගිණුමේ එය රු.32,462,342 ක් ලෙසත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ එය රු.48,442,160 ක් ලෙසත් වැඩියෙන් ද දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද මාර්ගවල වටිනාකම රු.917,332 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.20,860,955 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2020 ජනවාරි 01 දිනෙන් පසු වාහන මිලදී ගැනීම් සිදුවී නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේ වාහන ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.16,515,542 ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පෙන්වා දෙන ලද රු.20,388,313 ක ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රදාන එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2020 වර්ෂයේදී රු.142,700,000 ක පාලම් 04 ක් ඉදිකිරීම ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ලියාපදිංචි කරන ලද ට්‍රැක්ටර් ට්‍රේලරයේ වටිනාකම රු.400,000 ක් වුවත්, වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.40,000 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | වාහන සඳහා රු.165,542 ක බැටරි මිලදීගැනීම වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ සූර්ය බල ශක්ති පද්ධතියෙන් ලැබුණු ආදායම රු.368,191 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.281,583 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | බීජ බෙදාදීමේ ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.495,500 ක් වාහන කුලී ආදායම් ලෙස දක්වා තිබුණි. | -එම- | ආදායම් විෂයයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් අයිතම් 03 ක සහ වියදම් අයිතමයක විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ උපලේඛනයේ සඳහන් වටිනාකම් අතර රු.42,700 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | ගිණුම් ශේෂ අනුරූපී වාර්තා උපලේඛන සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ/ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන, වත්කම් හා වගකීම් ප්‍රකාශනය අනුව රු.57,220,145 ක් වුවත් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය අනුව එය රු.112,528,653 ක් වුයෙන් රු.55,308,508 ක වෙනසක් විය. | -එම- | වෙනස්කම්වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|---|
| | ------------------- | ------------- | --------------------- | ------------ | ---------- |
| | | රු. | | | |
| (අ) | යන්ත්‍ර | 15,472,368 | උපලේඛන | පිළිගන්නා බව. | තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්ෂය | 25,674,477 | -එම- | -එම- | -එම- |
| (ඇ) | 2022 වර්ෂයට පෙර ලැබිය යුතු බදු කුලී | 4,115,439 | (i) උපලේඛන<br>(ii) සනාථ කිරීම් ලිපිගොනු<br>(iii) කාල විශ්ලේෂණ | -එම- | -එම- |
| (ඈ) | ලැබිය යුතු බලපත්‍ර | 1,033,300 | -එම- | -එම- | -එම- |
| (ඉ) | කඩකුලී ගිවිසුම් ඇති | 158,500 | -එම- | -එම- | -එම- |
| (ඊ) | ටෙන්ඩර් ඇප තැන්පතු | 58,500 | -එම- | -එම- | -එම- |
| (උ) | පුස්තකාල තැන්පතු | 52,715 | -එම- | -එම- | -එම- |
| (ඌ) | විවිධ තැන්පතු 01 | 2,328,000 | -එම- | -එම- | -එම- |
| (එ) | විවිධ තැන්පතු 02 | 22,000 | -එම- | -එම- | -එම- |
| (ඒ) | විවිධ තැන්පතු 04 | 100,000 | -එම- | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.17,772,413 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.4,574,537 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයේදී ලැබී තිබුණු රු.2,895,950 ක මුද්දර ගාස්තු සහ රු.1,823,190 ක උසාවි දඩ මුදල් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා යොදවා නොගෙන සාමාන්‍ය පරිපාලන කටයුතුවලට අදාළ වියදම් වෙනුවෙන් යොදවා තිබුණි. | පිළිගන්නා බව. | ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා මෙම මුදල් යෙදවිය යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,912,000 | 1,813,337 | 1,990,529 | 1,187,787 | 1,988,400 | 1,786,680 | 1,832,939 | 1,364,979 |
| (ii) | කුලී | 10,754,032 | 11,354,170 | 10,585,683 | 7,362,317 | 11,206,000 | 6,991,454 | 7,893,798 | 6,593,830 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,633,500 | 990,755 | 1,364,055 | 1,034,300 | 5,035,000 | 813,848 | 431,548 | 1,407,600 |
| (iv) | වෙනත් ආදායම් | 5,504,150 | 3,271,366 | 5,608,599 | 1,171,855 | 5,964,000 | 2,138,473 | 333,803 | 3,509,088 |
| | | 22,803,682 | 17,429,628 | 19,548,866 | 10,756,259 | 24,193,400 | 11,730,455 | 10,492,088 | 12,875,497 |

## 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 1994 වර්ෂයේ දේපළ තක්සේරුව පදනම්ව වරිපනම් අයකරමින් පැවතුණු අතර නව ඉදිකිරීම්, ඉවත්කිරීම් වලට අනුව වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට රු.248,087 ක හිඟ හිටි වරිපනම් අයකරගෙන නොතිබුණි. | නව වරිපනම් තක්සේරු කිරීම සිදුවෙමින් පවතින බව. | නව වරිපනම් තක්සේරුව අනුව අයකිරීම් සඳහා කටයුතු කළ යුතු අතර හිඟ වරිපනම් අයකර ගත යුතුය. |
| (ii) | වරිපනම් නාම සංශෝධනය කිරීම් සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණු අතර වරිපනම් අයකර ගැනීම සඳහා ආදායම ඉක්මවා වියදම් සිදුකර තිබුණි. | නව වරිපනම් තක්සේරු කිරීම අනුව මෙම ගැටලුව නිරාකරණය වනු ඇති බව. | නව වරිපනම් තක්සේරුවෙන් පසු නිවැරදිව වරිපනම් නාම සංශෝධනය කර තිබිය යුතුය. |
| (iii) | වසර 01 ත් 10 ත් අතර කාලයක සිට පැවත එන ආයතන 128 කින් අයවිය යුතු කසළ බදු රු.867,300 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | වසා තිබූ ආයතන සඳහා බිල් කිරීම නිසා මෙම හිඟය ඇතිවී ඇති බව. | ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (iv) | වසර 01 ත් 02 ත් අතර කාලයක සිට පැවත එන ආයතන 21 කින් අයවිය යුතු ව්‍යාපාර බදු රු.68,400 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | පොදු වෙළඳපල ඇතුළත පිහිටි කඩ කාමර වෙනුවෙන් අයවිය යුතු රු.356,800 ක කුලී 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | මෙයට අදාළ ඇතැම් හිමිකරුවන් මියගොස් ඇති බව හා අදාළ ගිවිසුම් නොමැති වීම නිසා නීතිමය කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇති බව. | ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වසර 01 ත් 08 ත් අතර කාලයක සිට පැවත එන සභාව සතු කඩ කාමර 39 ක් වෙනුවෙන් අයවිය යුතු රු.1,157,430 ක හිඟ කුලී අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම කඩ කාමරවලට අදාළ ගිවිසුම් පළාත් පාලන දෙපාර්තමේන්තුවේදී අස්ථානගත වීම නිසා අයකිරීම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බව. | වගකිවයුතු පාර්ශව වෙතින් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (iii) | වසර 01 ත් 08 ත් ඉක්ම වූ කාලයක සිට පැවත එන වත්කම් බඳුදීම් වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.5,152,943 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මෙම හිඟයන්ට අදාළ ඇතැම් කඩ කාමරවල ගිවිසුම් අස්ථානගත වීම නිසා නඩු පැවරීමට නොහැකි වී ඇති අතර ඉතිරි කඩ කාමර සඳහා නඩු පවරා ඇති බව. | -එම- |
| (iv) | ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් පාර්ශව 30 කින් අයවිය යුතු හිඟ කුලී රු.1,051,944 ක් 2023 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | වසර ගණනාවක සිට අයකරගත යුතු පාර්ශව හඳුනාගෙන නොමැති රු.1,034,300 ක බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | වැරදි බිල්කිරීම් නිසා මෙම හිඟය ඇති වී ඇති බව. | ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | නල ළිං 177 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ නල ළිං ගාස්තු රු.373,900 ක් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.697,693 ක් හා මුද්දර ගාස්තු රු.68,259 ක් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරි කාලයේදී අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ තිබුණු බේල් කිරීමේ යන්ත්‍රය 2023 වර්ෂයේදී ගිනි ගැනීමෙන් විනාශ වී තිබුණු නමුත් ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකර එය යථාවත් කිරීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සහකාර පළාත් පාලන කොමසාරිස්වරිය දැනුවත් කර ඇති බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශව වෙතින් අලාභය අයකර ගැනීමටත්, බේල් කිරීමේ යන්ත්‍රය යථාවත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ පදික වෙළඳාමේ නියුතු වෙළෙන්දන් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර දෛනිකව නියමිත ගාස්තුවක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර නිවැරදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | LDSP ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද කඩ කාමර 10 කින් කඩ කාමර 03 ක් නිෂ්කාර්යව පැවතුණි. | මස් හා මාළු කඩ පැවැත්වීම සඳහා ලබාදීමට අවධානය යොමුකර ඇති බව. | නිෂ්කාර්යව නොපැවතීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොදු වෙළඳසැල ඉදිරිපිට පිහිටි කඩ කාමර 07 අතුරින් අංක 01 හා 02 යන කඩ කාමර අලුත්වැඩියා නොකිරීම නිසා 2018 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | අංක 01 සහ 02 කඩ කාමර 02 බදු දීමට සුදුසු තත්ත්වයේ නොපවතින බව. | මෙම කඩ කාමර බදු දීමට සුදුසු තත්ත්වයට පත්කළ යුතුය. |
| (ඇ) | කපුගොල්ලැව පොලිසිය වෙත 2021 ජුලි 01 දින සිට ලබාදී තිබුණු කඩ කාමරය ආපසු සභාව වෙත ලබාගැනීමට හෝ ගිවිසුම්ගතව ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගතවීමට පැමිණෙන ලෙස අදාළ පාර්ශව වෙත දන්වා ඇති බව. | ගිවිසුම්ගත වී කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලස්ම අනුව රු.662,860 ක සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර බොරළු මාර්ග සංවර්ධනය කිරීම, ජල පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ විවිධ අරමුදල් යටතේ කර්මාන්ත ව්‍යාපෘති සිදුකරන බවට සඳහන් කර තිබුණු නමුත් ඒ සඳහා ඇස්තමේන්තුගත වටිනාකමක් හෝ අදාළ කාර්යයන් මොනවාද යන්න හඳුනාගැනීමත් සිදුකර නොතිබුණි. | ඉදිරි කාලයේදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රු.3,200,577 ක් වැය කර ඉදිකරන ලද වත්කම් නිෂ්කාර්යව පැවති අතර දිරන කසළවලින් කාබනික පොහොර නිපදවීම සහ නොදිරන කසළ තේරීම් සිදුකර අලෙවි කිරීමක් සිදුකර නොතිබුණි. එම නිසා සභා බල ප්‍රදේශයෙන් දෛනිකව රැගෙන එන කසළ මොටෝගෝනැව රක්ෂිතයට අවිධිමත්ව බැහැර කර තිබුණි. | මේ වනවිට මෙම තත්ත්වය නිවැරදි කර ඇති බව. | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු විධිමත්ව සිදු කළ යුතුය. |